THE SINHALA- October 2008 - National Library of Australia
ISSN: 1834-7061

DESTINY

# දෛවය



ෂෙල්ටන් පීරිස් ලියූ කෙටිකතාවකි.

උසස් පෙළ විභාගයෙන් සමත්ව කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාව හැදෑරීමට වරම් ලැබූ අයියා, අම්මාගේ විරුද්ධත්වය ද නොතකා බැංකුවේ රැකියාවට ගියේ ලෙඩ ඇඳේ සිටි තාත්තා නිසා ඇති වූ අප හතර දෙනාගේ බර කර ගැසීමටයි. කෙසේ වෙතත් බාහිර උපාධි පංතිවලට ඇතුල් වී උපාධියක් ලබා, ගණිත ගුරුවරයකු වීමට ඔහු කුඩා කල සිටම පැතූ බව මට මතකයි. මීට මාස පහකට පමණ පසු අප අතරින් වෙන් වූ තාත්තා නිසා ලැබූ අභියෝගයද ඔහු බාර ගත්තේ නොසැලෙන සිතිනි.

තාත්තාගේ හත් දිනේ දානයට අම්මාගේ එකම සොහොයුරා වන මාමා හා නැන්දා, ප්‍රමුඛ ස්ථානයක් ගෙන වැඩ කළේ ඔවුන් කළ යම් වරදකට සමාව අයදින්නාක් මෙනි. එදින වරක් තාත්තාගේ ඡායාරූපය දෙස බලා සිටි මා වෙතට පැමිණි මාමාගේ එකම දියණිය වන නිශා නංගී, 'සේන අයියේ දැන් දුක් වෙන්න එපා. ඔයාලට අපි ඉන්නවනේ. අර හංදියෙ ඉන්න පියදාස මාමා කීවා අයියාගෙ තාත්තා, ජයවීර මාමා දිව්‍ය ලෝකෙ යන්න ඇති කියලා. ජයවීර මාමා කොච්චර හොඳ කෙනෙක්ද?' කියා කීවේ මගේ සිත සැනසීමටයි.

තාත්තාගේ තුන්මස දානයට පෙර දින අයියාගේ බාහිර උපාධි ප්‍රතිඵල ලැබුණි. ඔහුට දෙවෙනි පෙළ උසස් සාමර්ථයක්ද ලැබී ඇත. රැකියාවක් කරමින් මෙතරම් උසස් ලෙස උපාධිය සමත් වීම ගැන මටද අයියා ගැන ආඩම්බර සිතුනි.

*දැන් මාස හතරකින් පොලී සල්ලි ගෙවලත් නැහැ. හෙට අනිද්දම මේ උගස බේර ගත්තොත් හොඳයි.*

'අම්මෙ මට දැන් උපාධි ගුරු තනතුරකට ඉල්ලන්න පුළුවන්. දානෙන් පස්සෙ ඉල්ලුම් පත්‍රයක් දාන්න ඕන.'

තාත්තාගේ අවසාන කටයුතුද, දානයද නිසා නිවසේ උගස ගැන අම්මාට හෝ අයියාට කිසිවක් මතක තිබී නැත. එක් දිනක් සරනේලිස් මාමා ඒ ගැන කතා කළ ආකාරය මගේ සිත් ගත්තේ නැත.

'රොසලින් අක්කෙ, දැන් මාස හතරකින් පොලී සල්ලි ගෙවලත් නැහැ. මටත් මේ දිනවල මුදල් හදිසියක් තියෙනවා. හෙට අනිද්දම මේ උගස බේර ගත්තොත් හොඳයි. නැත්නම් මම තව රුපියල් තුන්දාහක් දෙන්නම්. මේක මටම ලියලා දෙන්න.'

'අනේ සරනේලිස් මල්ලියෙ. මේ කරදර නිසා ඔක්කොම අමතක උනා. අපිට තව ටිකක් කල් දෙන්න. මම ලොකු පුතාට කියල කොහොම හරි ණය ටික ගෙවලා දාන්නම් ඉක්මනටම.'

'එහෙම කියල බැහැනේ. දැන් ජයවීර අය්යත් නැහැනේ. මම තව සති හතරක් කල් දෙන්නම් දෙසැම්බර් මාසෙ අග වෙනකම්. බැරිනම් මම ලියන මහත්තයත් එක්කම එන්නම් මෙහාට' කියූ ඔහු නැගිට ගියේ කපටි සිනාවක්ද ඇතුව. තාත්තාගේ ඥාති සොහොයුරකු වූ ඔහු, අත මිට සරු වෙළඳ ව්‍යාපාරිකයකු විය.

අම්මාගෙන් විස්තරය ඇසූ අය්යා කලබල වූයේ නැත. වරක් ඔහු මළ හිරු බසින අහස දෙස බලා සිටින අයුරු දුටු මසිතටද බියක් ඇති විය. එහෙත් ටික වේලාවකින් ඔහු ගෙතුලට ආවේ දැඩි අධිෂ්ඨානයකිනි.

'අම්මේ ආයෙත් සරනේලිස් මාම ඇහුවොත් කියන්න අපි මාසෙ අන්තිමට ගේ දීල යනව කියල.'

'එතකොට පුතේ අපි කොහේද යන්නෙ?'

'මම අම්මයි මල්ලිවයි අරගෙන කොහේ හරි යනව. අර ආච්චි කිව්ව වගේ උඩ ඉන්න දෙවියො අපිව බලා ගනීවි. තාත්තත් අපි ගැන බලා ඉන්නව ඇති.'

* * * *

ඊට දින දෙකකට පසුව අය්යා ගේ නමට ලැබුනු රා. සේ. පි. ලිපිය කියවූ ඔහු ඉතා සතුටට පත් වූ බවක් පෙනුනි.

'අම්මෙ මට ගුරු පත්වීමක් ලැබිල තියෙනව අනුරාධපුරයේ. දෙසැම්බර් ඉඳන් වැඩ බාර ගන්න තියෙන්නේ. පඩිය රුපියල් හාරසිය අසූවක් දෙනවලු මාසයකට.'

'අනේ ලොකු පුතේ උඹ ඉතාමත්ම ආසාවෙන් හිටපු රස්සාව නේ ගුරුකම. උඹට තුනුරුවන්ගේම පිහිට ලැබෙන්න ඕන' කියා අය්යාගේ හිස අත ගෑවාය.

'අම්මෙ මම හෙටම අනුරාධපුරේ ගිහිල්ල විදුහල්පති තුමා මුන ගැහිල විස්තර බලාගෙන එන්නම්.'

* * * *

පසු දින රාත්‍රී නවයට පමණ අය්යා ගෙදර ආවේ අපමණ සතුටු මුහුණකිනි.

කෑම කන අය්යා 'අම්මෙ මට විදුහල්පති තුමා මුන ගැහුන. හරිම රත්තරං, කරුණාවන්ත මනුස්සයෙක්. එහේ හිටපු ගණිතය උගන්නපු මහත්තයා විශ්‍රාම යනව නොවැම්බර් මැද්දෙදි. ඒ නිසා මට ඒ ගුරු නිවාසයත් දෙන්නම් කිව්වා.'

'පුතා ඉතිං කවදද වැඩ බාරගන්නව කීවෙ?'

'මම කීව නොවැම්බර් විසි නවවන සෙනසුරාද බඩුත් අරගෙන එන්නම් කියල. එතකොට දෙසැම්බර් පලවෙනිද ඉඳල වැඩ බාරගන්න පුලුවන්නේ!'

'ඒක හොඳයි පුතේ!'

'අම්ම හෙට සරනේලිස් මාමට කියන්න අපි ගේ ලියල දෙනව කියල රුපියල් පන්දාහක් දෙන්න කියන්න. අපි නොවැම්බර් අන්තිමට ගේ බාර දෙනව කියන්න. කොහෙද යන්නෙ කියන්න එපා. කාටවත්ම මේ ගැන දැන්ම කියන්න එපා.'

* * * *

කේවල් කිරීමෙන් පසු ගේ ලියවා ගත් සරනේලිස් මාමා කීවේ 'ජයවීර අය්යා නිසා තමයි මම මේ ගාන දෙන්නේ. නැත්නම් රුපියල් තුන්දාහකට වැඩිය මේ ගේ වටින්නේ නැහැ' කියාය.

# දෛවය

ෂෙල්ටන් පීරිස්

මුදල් භාරගත් අම්මා 'කොහොමත් ඔක්කොම වෙන්නෙ හොඳට සරනේලිස් මල්ලියේ. මම දැන් හිත හදාගෙන ඉන්නෙ' කියා දෑස් පිස දැම්මාය.

පසු දින රාත්‍රී අප යන බව මාමාට කීමට ගිය අම්මා ආපසු පැමිණ කීවේ 'නිශා කෙල්ල ඇහුව ඇයි සේන අය්ය ආවෙ නැත්තෙ කියල. හරිම සීදේවි කෙල්ල හරියට අය්ය පොඩි කාලෙ වගේමයි. හරිම අහිංසකයි. හෙට රෑට මාම එක්ක එනව කිව්ව උඹල බලන්න.'

* * * *

අප බලාපොරොත්තු වූයේ සිකුරාදා රෑ එකොලහට පමණ මෙහෙන් පිටත් වීමටය. ඒ අතර නිශා නංගී මාමා සමඟ අප බලන්න පැමිණියාය.



මාමා අම්මා සමඟ කතාකරමින් සිටින විට මා ලඟට පැමිණි නංගී 'ඇයි සේන අය්යෙ ඔයාල මෙහෙන් යන්නෙ? අපි එක්ක තරහ වෙලාද? අය්යල ගියාම මට තමයි පාලු වෙන්නෙ. අය්ය ගියාම ඇඩ්‍රස් එක කියල ලියුමක් එවන්න හොඳේ' කිව්වේ කඳුලු පිරී දෙනෙතිනි.

'අය්යේ, මේ බුදු රූපෙ තියන්න ඔයාගෙ අලුත් කාමරේ මාව මතක් වෙන්න. හැමදාම මල් තියල බුදුන්ට වඳින්න.'

'මොනවද නංගි මම ප්‍රාර්ථනා කරන්නෙ වැන්දට පස්සෙ?' මා ඇසුවේ සිනාසෙමිනි.

'මේ නිශා ලබන ආත්මෙදි ඔයාගෙම නංගි වෙන්න කියල ප්‍රාර්ථනා කරන්න!' ඇය වෙව්ලන කට හඬින් කීවාය. ඇගේ ඇස් වල කඳුලු පිරී තිබෙනු දැක මට ද විශාල දුකක් ඇතිවිය.

*'මේ නිශා, ලබන ආත්මෙදි ඔයාගෙම නංගි වෙන්න කියල ප්‍රාර්ථනා කරන්න!' ඇය වෙව්ලන කට හඬින් කීවාය.*

'නංගි ලබන අවුරුද්දෙ සාමාන්‍ය පෙල ලියනවනේ. ඒ නිසා හොඳට පාඩම් කරන්න.'

'අය්ය උසස් පෙල පන්තියට අලුත් ඉස්කෝලෙකට යනව නේද? අනේ අය්යට මාව අමතක වේද දන්නෙ නැහැ අලුත් යාලුවො හම්බ උනාම.'

'ඔයා මගෙ නංගිනෙ ළමයො. මට කොහොමද ඔයාව අමතක වෙන්නෙ?'

* * * *

පසුදා උදේ හත හමාර පමණ වන විට අප ගුරු නිවාසය වෙත ලඟා වීමු. පැල වලට වතුර දමමින් සිටි විදුහල්පති තුමා පැමිණියේ සිනා මුසු මුහුනින් යුතුවය.

'සුභ උදෑසනක් වේවා! රණබන්ධු මහත්තය. මහත්තය උදෙන් ඇවිල්ල වගෙයි.'

'එහෙමයි සර්. මේ මගේ අම්මයි මල්ලියි. මේ අපේ ළඟම නෑයෙක් පියදාස මාමා.'

අම්මා හා පියදාස මාමා ඔහුට ආචාර කළ අතර මම ඔහුට දනගසා වැන්දෙමි.

'මේ පුතා දැන් මොන පන්තියෙද?'

'මම සාමාන්‍ය පෙළ කලා සර්. වාණිජ්‍යයෙන් උසස් පෙල කරන්න තමයි හිතාගෙන ඉන්නෙ.'

'මේ ඉස්කෝලෙ වාණිජ පංති නැහැ. ඒත් හැතැප්ම දෙකක් විතර ඈතින් තියෙනව පැරකුම් විද්‍යාලය. උදේටයි හවසටයි බස් එකේ යන්න වෙනවා.'

ගුරු නිල නිවස පිහිටා තිබුන පරිසරය මා හිත් ගත්තේ නිතැතිනි. ඈතින් පෙනෙන කුඩා කඳු ගැටයත්, ගෙය වටා ඇති කුඹුරු යායත්, පලබරවූ විවිධ පළතුරුත්, විවිධ එළවලුත් එහි සිරියාව දෙගුන තෙගුන කරවීය. නිවසේ විදුලිය තිබීම ඉතා අගනා බව මට සිතුනි.

* * * *

උසස් පෙළ, වාණිජ විද්‍යාව හැදෑරීමට මට පැරකුම් විද්‍යාලයට පහසුවෙන් ඇතුලත් වීමට ලැබුනි. ළමයින් විසි දෙකකින් යුතු අපේ පංතියට, ආර්ථික විද්‍යාව ඉගැන්වීමට නව වසරේ සිට නව ගුරුතුමියක් එන බව ඇසීමෙන් අප මහත් සතුටට පත් වීමු. වැඩ බාරගත් පළමු දිනයේ විස්තරයක් කළ විදුහල්පති සෙනෙවිරත්න මහතා, ඇය නමින් විශ්වකාන්ති ප්‍රියදර්ශනී වන බවත්, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ උපාධාරිනියක බවත්, ගමට සේවය කිරීමට පැමිණි, ගමේම හැදුනු වැඩුන, ගමේම යුවතියක් බවත් කියූ හැටි මට තවම මතකය. නමටම ඔබින රූපයක් සහ කාරුණික හදවතක් ඇති ඇය නිසා අප හැමගේ ආර්ථික විද්‍යාවට ඇති ඇල්ම දෙගුණ තෙගුණ විය.

ඊට මසකට පමණ පසු තිබුන අන්තර් පාසැල් මළල ක්‍රීඩා තරගයේදී විශ්ව කාන්ති ටීචර් හා අය්යා කතා කරමින් සිටින බව දුටු මා හට ඇති වූයේ මහත් ආඩම්බරයකි.

ඒ වසර අවසාන වන විට අය්යා අධ්‍යාපන ඩිප්ලෝමාව සමත් වී තිබුණි. මේ වසරේ උසස් පෙළ විභාගයෙන් සිසුන් පස් දෙනෙක් ඉංජිනේරු පීඨයටද හතර දෙනෙක් විද්‍යා පීඨයටද සමත් ව තිබීම, අය්යා ලත් ජයග්‍රහනයක් විය. මේ නිසා දෙමව්පිය ගෞරවය අය්යාට නොඅඩුව ලැබුණි. මින් උද්දාමයට පත් ප්‍රාදේශීය ඇමති තුමා, ශ්‍රී රාජසිංහ විදුහලේ පුරප්පාඩුවක්ව පැවති නියෝජ්‍ය විදුහල්පති තනතුරට අය්යා පත් කළේය. විද්‍යා පන්ති නොමැති අපේ විදුහලින් ද ළමයින් තුන් දෙනෙක් පේරාදෙනියටද, දෙදෙනෙක් කොළඹට ද තේරී තිබුණි.

දොළහ වසර පටන් ගත් පසු අපට ඉතා වැඩ අධික කාලයක් උදාවිය. විශ්වකාන්ති ටීචර් සතියට දින දෙකක් අතිරේක පන්ති පවත්වා අප උනන්දු කළාය.

අය්යා හා විශ්වකාන්ති ටීචර් පසුගිය කාලය තුල කීප විටක්ම හමු වූයේ අන්තර් දිස්ත්‍රික්ක හා පාසල් ක්‍රීඩා තරඟ සංවිධානය කිරීමටය. සමහර සෙනසුරාදා දිනවල ළමයින් පුහුණු කිරීමට යන ඔවුන් දිගු වේලාවන් කතා කරමින් සිටිනු මම දැක ඇත්තෙමි. ළමයින් ද මේ ගැන ඉඟි කර ඇති බව මම දනිමි. 'ඇය මගේ අක්කා වන්නේ නම් කොතරම් හොඳද'යි සිතුනු සිතිවිලි වසා ගත්තේ දැඩි බියකිනි.

ඒ සෙනසුරාදා දිනය මට අද වාගේ මතකය. විශ්වකාන්ති මිස් විසින් දෙන ලද ආර්ථික විද්‍යා පැවරුමක් නිම කරමින් සිටි මා දුටුවේ කාරයකින් බැස අප නිවස දෙසට එන මැදි වියේ යුවළකි.

'රණබන්දු මහත්තය ඉන්නවද?' ඉතා කාරුණාවන්තව ඇසූ ඒ මහතා ගේ තුල හොඳින් විපරම් කළේය.

'ඔව් අය්‍ය කාමරේ. මහත්තයල කරුණාකරල වාඩි වෙන්න. මම අය්‍යට කතා කරන්නම්.'

'රණබන්දු මහත්තය. මම අභයසේන හේරත්. විශ්ව කාන්ති ටීචර්ගෙ අප්පච්චි. මේ අම්මා සිරියලතා මැණිකේ. අපි මේ ආවේ මහත්තය මේ ගමට කරන සේවයට ස්තුති කරන්න. මේ ගමේ අය හැම දෙනාම මහත්තය කරන සේවය වර්ණනා කරනව. මහත්තයගෙ පැමිණීමෙන් ගමට ලොකු එළියක් ලැබුනා. උද්‍යෝගයක් ඇති වුනා. අපේ දූවත් ඒ ගැන නිතරම කතා කරනවා' කියූ හේරත් මහතා ඔහුගේ බිරිඳ දෙස බැලුවේය. අය්‍යා ලැජ්ජාවෙන් බිම බලාගත් බව මම දුටිමි. කිසි දා නුදුටු හදිසි චකිතයක්ද ඔහු වටා අරක්ගෙන තිබුනි.

'බොහොම ස්තුතියි ඒ කතාවට. මම මගේ සේවය හොඳින් ඉටු කළා විතරයි. මම එයින් ලබන්නේ හරිම සතුටක්. ළමයි හොඳට ඉගෙන ගත්තම, විශ්ව විද්‍යාලයට ගියාම දැනෙන සතුට කියල නිම කරන්න බැහැ. ළමයින්ගේ දෙමව්පියන්ට වගේම අපටත් ඒක හරි සතුටක්. අපේ මල්ලිත් විශ්වකාන්ති මිස්ගෙ ගෝලයෙක්. මල්ලිත් කියනව විශ්වකාන්ති මිස් උත්සාහ කරන්නෙ සැම දෙනාම විශ්ව විද්‍යාලෙ යවන්න කියල.'

'මට තවත් වැදගත් දෙයක් කතා කරන්න තියෙනව මහත්තයත් එක්ක. කෝ අම්මා ඉන්නවද?'

අම්මා එවිටම රසකැවිලි පිරුනු බන්දේසියක් රැගෙන සාලයට පැමිණීම ඉතා අගේ බව මට හැඟුනි. තේ පානයෙන් පසු ඔවුන් බර කතාවකට සූදානම් වන බව හැඟුන නිසා මම පිටු පස දොරෙන් වත්තට ගියේ පැලවලට වතුර ටිකක් දාන්න හිතාගෙන. අමුත්තන් ගිය පසු අම්මා කියූ කතාවෙන් ද, අය්‍යාගේ මූවේ පැතිරුන පිරිපුන් සිනාවෙන්ද, සිදුව ඇත්තේ කුමක්දැයි සිතා ගත හැකි විය.

'හරිම රත්තරං මනුස්සයො. අපි ගැන කිසිම දෙයක් හෙව්වෙවත් ඇහුවෙවත් නැහැ. කුලමල, ඉඩකඩම්, වත්පොහොසත් කම්, පරම්පරා ගැන කිසිම දෙයක් බැලුවෙ නැහැ. පුතාගෙ ගතිගුණ ගැන පැහැදිලා. ඒ ගැන විතරයි එයාල කතා කලේ.'

අය්‍යා කිසිවක් කතා නොකලේ හිතේ සතුට වැඩි කමට වෙන්න ඇති. 'එතකොට විශ්වකාන්ති මිස් මගේම අක්ක වෙනව. කොච්චර වාසනාවක්ද දෙයියනේ ඒක.'



## දෛවය

ෂෙල්ටන් පීරිස්

'එහෙනම් පොඩි පුතාත් ලෑස්තිවෙන්න සෙනසුරාදට විශ්වකාන්ති ටීචර්ලගෙ ගෙදර යන්න. ලොකු පුතේ කරුණාදාස මහත්තයටයි නෝනටයි මේ විස්තරය කියල එයාලටත් ආරාධනය කරන්න අපි එක්ක යන්න එන්න කියල. පුතාට බොහොම හිතවත් පවුලක් නේ.'

'ඒක හොඳයි අම්මේ. මම හවසට ගිහිල්ල කරුණාදාස මහත්තයට විස්තරේ කියල මහත්තයටයි නෝනටයි අපි එක්ක යන්න එන්න කියන්නම්' අය්‍යා කීවේ මහත් සතුටින්.'

පසුගිය දින කීපයේ වෙනදාට වැඩි වේලාවක් කැඩපත ඉදිරියේ සිටි අය්‍යා, විටෙක එය සමග සිනා සී ගීත ගයා ඇත්තේ මේ නිසා විය හැකි බව මට සිතුනි.

* * * *

සෙනසුරාදා උදේ එකොලහට පමණ පැමිණි කරුණාදාස මහතා හා එම මහත්මිය පැමිණි කාරයට නැගගත් අපි පැය බාගයකින් පමණ විශ්ව කාන්ති මිස්ගේ ගෙදරට ලඟාවුනා. මගදී කරුණාදාස මහත්මිය කළ විහිලු කීපයකට ප්‍රති උත්තර ලෙස අය්‍යා සිනාසුනා මිස කිසිවක් නොකීවේ මහුගේ සුන්දර මනෝ ලෝකයෙන් ඉවත්වීමට අකමැති නිසා වෙන්න ඇති. ඉතාම අලංකාර ලෙස ගේ ඉදිරි පස මල් වවා තිබුනි. දෙමහල් නිවසක් වූ එය මා සිත් ගත්තේ අවට පරිසරය නිසායි. මිස් හා ඇගේ දෙමාපියන් අප පිළිගත්තේ ඉතාම සෙනෙහසින්.

මුලින්ම ඉතා සරු තේ පැන් සංග්‍රහයක් අපට ලැබුනි. ඊට පසු පාසල ගැනත්, විශ්ව විද්‍යාල ගැනත්, ගමේ දියුණුව ගැනත් කතා කළ ඔවුන් පංසලේ නායක් ස්වාමීන් වහන්සේගෙන් ගමට සිදුවන මෙහෙය අගය කිරීමටද අමතක කළේ නැහැ.

ටික වේලාවකින් කරුණාදාස සර්ට ඉඟියක් කළ මිස්ගේ පියා, එහි සිටි අනෙක් වැඩි හිටියන්ද සමග ඇතුලට ගොස් නැවත පැමිණියේ ටිකක් දොඩමලුවීය.

'කරුණාරත්න සර් දන්නවද මේ අපේ පොඩි දූව පේරාදෙනියෙ ඉගෙන ගන්න කාලෙ අපි හිතුවෙ, එයා එහෙන්ම සහකාරයෙක් හොයා ගනීවි කියලයි.'

'එයා පේරාදෙනියෙ නැහැ අප්පච්චි. එත් මේ ලංකාවෙ කොහේ හරි ඉපදිල ඇතියි කියලයි මට හිතෙන්නෙ. අර "සඳ ඇති රැයක" නවකතාවෙ නුවර පෙරහැර බලද්දී රමණීට සිරිපාලව හමු වුනා වගේ මටත් එයාව හමුවේවි. එතකං මං බලං ඉන්නව අප්පච්චි කියල දූව හැමදාම හිනාවේවී කියනව.'

'ඉතිං දූව කීව වගේ අපිත් බලාගෙන හිටිය. එයා කීව වගේම එයාගෙ හිමිකාරයා ලංකාවෙ ඉඳල තියෙනවනේ.

'දැන් බලන්න මේ රණබන්දු මහත්තයා උපාධිය පාස් වෙලා මේ පලාතටම ආපු හැටි. ඒක තමයි මහත්තයෝ දෛවය කියල තියෙන්නෙ. කාටවත් වලක්වන්න බැහැ. ඒක මේ නොපෙනන පොතක ලියල තියෙනව වගේ. ඒකෙ පිටු පෙරලෙන්නෙ ඉබේටම, අද්භූත බලවේගයකින්.'

'ලබා උපන් හැටියටයි බඹා කොටන්නේ!!! කියල කියනවනේ' කරුණාදාස මහතා එසේ පැවසූයේ සියළු දෙනාගේම මුහුණුවලට සිනාවක් නංවමිනි.

නිමි.